## කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්වාගණනය කල මතය

මෙම වාර්තාවේ 1.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශන වලින් 2011 දෙසැම්බර් 31 දිනට කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයන් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම.

1.2.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත (ශ්‍රී.ල.ගි.ප්‍ර.)

ප්‍රධාන කාර්යාලය සහ ගාල්ල, මාතර, රත්නපුර, නුවරඑළිය, ඌව හා කළුතර ප්‍රාදේශිය කාර්යාලවල දැනට භාවිතයේ පවතින රු.29,264,400 ක් පිරිවැයකට මිලදී ගත්, සම්පූර්ණයෙන් ක්ෂය කරන ලද වාහන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 18 ප්‍රකාරව ප්‍රත්‍යාගණනය කර ගිණම්වලට ගෙන නොතිබුණි.

1.2.2 ගිණුම්කරණ අඩුපාඩු

විගණනයේදී පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) හානිවූ , යල් පැනගිය හා භාවිතයට නොගන්නා හා ගබඩාවේ පැවති උෆණතා සැලකිල්ලට ගැනීමෙන් තොරව ඌව, කළුතර ,නුවරඑළිය, මාතර, රත්නපුර හා ගාල්ල ප්‍රාදේශිය කාර්යාලවල සමාලෝචිත වර්ෂය අවසානයට තොගය රු.277,674ක් පොත් අගය මත ගිණුම් ගත කර තිබුණි.

(ආ) කෘෂිකාර්මික සංවර්ධනය සඳහා වූ ජාත්‍යන්තර අරමුදල (IFAD) වැඩසටහන මඟින් අධිකාරියට ප්‍රදාන ලෙස ලැබී තිබුණු රු.388,420 ක් වටිනාකම වූ නුවරඑළිය ප්‍රාදේශිය කාර්යාලයේ යතුරුපැදියක් හා පරිගණකයක් ප්‍රදාන ලෙස දක්වනු වෙනුවට ගෙවිය යුතු ශේෂයක් ලෙස සාවද්‍යාව දක්වා තිබුණි.

(ඇ) 2011 දෙසැම්බර් 31 දිනට ස්ථාවර තැන්පතුවලින් හා ක්ෂණික තැන්පතු වලින් රු.587,780 ක පොලී ලැබිය යුතු ලෙස ගිණුම් වල දක්වා තිබුණද බැංකු සනාථ කිරීම් වලට අනුව සමාලෝචිත වර්ෂය තුලදී එම මුදල ලැබී තිබුණි.

1.2.3 නොසැසඳ ශේෂ

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) බැංකු සැසඳුම් ප්‍රකාශවල දැක්වෙන මුදල් පොතේ ශේෂ හා 2011 දෙසැම්බර් 31 දිනට මුදල් පොත්වල ශේෂ අතර රු.160,909ක වෙනසක් නිරීක්ෂණය විය.

(ආ) උපලේඛණ වලට අනුව, 2011 දෙසැම්බර් 31 දිනට තේ ශක්ති අරමුදලෙන් ලැබිය යුතු ණයගැති වටිනාකම රු.75,213,449 ක් වුවද තේ ශක්ති අරමුදලේ ගිණුම් වලට අනුව එය රු.74,048,540 ක් විය. ඉහත ගිණුම් දෙක අතර වූ රු.1,164,913 ක වෙනස සමාලෝචිත වර්ෂය තුලදී සසඳා නොතිබුණි.

1.2.4 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

(අ) රු.81,139,404 ක් වූ ණයගැතියන් (ප්‍රධාන කාර්යාලය) වර්ෂ 5 කට වැඩි කාලයක් අයකර ගැනීමෙන් තොරව පැවතුණි. අධිකාරියේ සභාපති විසින් තේ ශක්ති අරමුදලෙන් ලැබිය යුතු රු.75,213,449 ක් වූ ශේෂය ලියා හැරීමට මහ භාණ්ඩාගාරයෙන් අනුමැතිය ලැබී නොමැති බවත්, රු.5,916,590 ක් වූ ලැබිය යුතු ණයගැතියන් සඳහා වූ නීතිමය කටයුතු ආරම්භ කර ඇති බවත් ඔහගේ පිළිතුරෙහි දක්වා ඇත.

(ආ) ණයගැතියන් හා ණයහිමියන් (ප්‍රාදේශීය කාර්යාල) පිළිවෙලින් එකතුව රු.4,514,317ක් හා රු.430,557 ක් වර්ෂ 5 කට වැඩි කාලයක් අයකර ගැනීමෙන් / නිරවුල් කර ගැනීමෙන් තොරව පැවතුණි.

(ඇ) හන්තාන පුහුණු මධ්‍යස්ථානය ඉදිකිරීම සඳහා ලබා දෙන ලද රු.12,968,728ක අත්තිකාරමක් දීර්ඝ කාලයක සිට අයකර ගෙන නොතිබුණි. ගිණුම් පොත් වලින් එම අත්තිකාරම ලියා හැරීම සඳහා මහ භාණ්ඩාගාරයේ අනුමැතිය අපේක්ෂාවෙන් සිටින බව අධිකාරියේ සභාපති විසින් ඔහුගේ පිළිතුරෙහි දක්වා තිබුණි.

(ඈ) රු.9,166,678 ක් වූ නැවත උපලේඛනගත කරන ලද වාහන ණය අයකර ගැනීමෙන් තොරව වර්ෂ 5 කට වැඩි කාලයක් ඉදිරියට ගෙන එමින් තිබිණි.

1.2.5 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම.

විගණනයේදී නිරීක්ෂණය වූ නීති, රීති, රෙගුලාසි වලට අනුකූල නොවීම් අවස්ථා පහත දැක්වේ.

| | නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව. | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | රජයේ මුදල් රෙගුලාසි | |
| | (i) මු.රෙ. 104 (2) සහ මු.රෙ. 110 | රෙගුලාසි ප්‍රකාරව නැතිවීම් විගණකාධිපති වෙත වාර්තා කර නොතිබුණු අතර එම නැතිවීම් සටහන් කිරීම සඳහා වෙනම ලේඛණයක් අධිකාරිය විසින් පවත්වා |

| | |
|---|---|
| | නොතිබුණි. |
| (ii) මු.රෙ 1645 සහ මු.රෙ 1646 | අධිකාරියේ වාහන 26 කට අදාලව දෛනික ධාවන සටහන් වාර්තා හා මාසික කාර්යසාධන වාර්තා රෙගුලාසි ප්‍රකාරව විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර නොතිබුණි. |
| (ආ) භාණ්ඩාගාර චක්‍රලේඛ | |
| (i) 1978 දෙසැම්බර් 12 දිනැති අංක 842 | චක්‍රලේඛ උපදෙස් පරිදි ස්ථාවර ලේඛණයක් විධිමත්ව පවත්වා නොතිබුණි. |
| (ii) 2002 නොවැම්බර් 28 දිනැති අංක අයි ඒ අයි /2002/02 | චක්‍රලේඛ උපදෙස් වලට අනුකූලව පරිගණක උපාංග හා මෘදුකාංග වලට අදාලව ස්ථාවර ලේඛණයක් පවත්වා නොතිබුණි. |

## 2 මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා, අධිකාරියේ මෙහෙයුම් කටයුතුවලින් වූ ප්‍රතිඵලය රු.මිලියන 12.7 ක ශුද්ධ ඌනතාවයක් වූ අතර, ඊට අනුරූපව, ඉකුත් වර්ෂයේ ශුද්ධ ඌනතාවය රු.මිලියන 4.5 ක් වූ හෙයින්, රු.මිලියන 8.3 කින් මූල්‍ය ප්‍රතිඵලයේ තවදුරටත් පිරිහීමක් දැක්වුණි. සංවර්ධන වියදම් හා වැටුප් පිළිවෙලින් රු. මිලියන 18.8 කින් හා රු.මිලියන 10.0 කින් වැඩිවීම මෙම පිරිහීමට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

### 2.2 අධිකාරියේ සමුච්චිත අරමුදල

ලබා ගත හැකි වූ තොරතුරු අනුව, ආරම්භක ප්‍රාග්ධනයක් අධිකාරියට නොවූ අතර මහ භාණ්ඩාගාරයෙන් හා වෙනත් ව්‍යාපෘති වලින් 2011 දෙසැම්බර් 31 දිනට ලැබී තිබුණු රු.212,472,868ක් වූ සියළුම ප්‍රදාන මූල්‍ය ප්‍රකාශන වල සමුච්චිත අරමුදල ලෙස දක්වා තිබුණි.

## 3. කාර්ය සාධන සමාලෝචනය

### 3.1 තේ නිෂ්පාදනයට කුඩා තේ වතු හිමියන්ගේ දායකත්වය

විගණනයට ලබා ගත හැකි වූ තොරතුරු වලට අනුව, සමාලෝචිත වර්ෂය තුල ශ්‍රී ලංකාවේ මුළු තේ නිෂ්පාදනය කිලෝ ග්‍රෑම් මිලියන 328.37 ක්වූ අතර, එහිදී කුඩා තේ වතු හිමියන්ගේ දායකත්වය කිලෝ ග්‍රෑම් මිලියන 229.94 ක් හෙවත් 70% ක් විය. ඉකුත් වර්ෂයේ ශ්‍රී ලංකාවේ මුළු තේ නිෂ්පාදනය කිලෝ ග්‍රෑම් මිලියන 331.4 ක් වූ අතර, කුඩා තේ වතු හිමියන්ගේ

දායකත්වය කිලෝ ග්‍රෑම් මිලියන 230.13 ක් හෙවත් 69.44% ක් විය. ඒ අනුව සමාලෝචිත වර්ෂයේ කුඩා තේ වතු හිමියන්ගේ දායකත්වය 0.56% කින් වැඩිවී තිබුණි.

3.2 තේ වගා සංවර්ධනයන්

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂය තුල සහනාධාර , ව්‍යාප්ත කිරීම හා සමාජ සංවර්ධන කාර්යයන් සඳහා රු.මිලියන 208 ක් වැය කර තිබුණි. සමාලෝචිත වර්ෂයේ හා ඉකුත් වර්ෂ 04ක වගා සංවර්ධන පිරිවැය හා සංවර්ධන පිරිවැය රු.1කට ක්‍රියාත්මක කිරීමේ පිරිවැය පහත දැක්වේ.

| | 2007 | 2008 | 2009 | 2010 | 2011 |
|---|---|---|---|---|---|
| සංවර්ධන පිරිවැය රු. මිලියන | 183.8 | 208.3 | 185.7 | 189.2 | 208.0 |
| ක්‍රියාත්මක කිරීමේ පිරිවැය රු. මිලියන | 179.0 | 188.7 | 202.1 | 205.4 | 218.5 |
| සංවර්ධන පිරිවැය රු.1 කට ක්‍රියාත්මක කිරීමේ පිරිවැය | 0.97 | 0.91 | 1.08 | 1.08 | 1.04 |

මෙ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සහනාධාර යෝජනා ක්‍රම යටතේ තේ වගා කිරීම

(i) ජාතික ප්‍රතිපත්තියට අනුව, උපරිම ඵලදාව ලබා ගැනීමට හා තේ වතු නඩත්තු කිරීමට වාර්ෂිකව හෙක්ටයාර 2,200 ක් තේ නැවත වගා කල යුතුය. කෙසේ වුවද අධිකාරියට අනුව සමාලෝචිත වර්ෂය තුල හෙක්ටයාර 772 ක් පමණක් නැවත වගා කර තිබුණි.

(ii) 2010 වර්ෂයේ සිට කෑගල්ල හා කළුතර දිස්ත්‍රික්ක වල තේ නැවත වගා කිරීම ආරම්භ කර තිබුණු අතර, ඉලක්කගත ප්‍රදේශයෙන් 56.76%ක් සම්පූර්ණ කර තිබුණි.මෙ සඳහා රු.මිලියන 2.5ක ප්‍රතිපාදනයෙන් රු.මිලියන 1.186 ක් හෙවත් 47.44% ක් සහනාධාර ලෙස ගෙවා තිබුණි.

(ඇ) ව්‍යාප්ත කිරීම හා උපදේශක සේවා

(i) අධිකාරියට අනුව සමාලෝචිත වර්ෂය තුල ව්‍යාප්ත සේවා කාර්ය මණ්ඩලය විසින් පුද්ගල ව්‍යාප්ත සේවා 26,103 ක් හා කණ්ඩායම් වැඩසටහන් 6,970ක් පවත්වා තිබුණු අතර එය පෙර වර්ෂය හා සැසඳීමේදි පිළිවෙලින් 4.5% ක හා 2.57% ක අඩුවීමක් විය.

(ii) සමාලෝචිත වර්ෂය තුලදී වගාකරුවන් 175,849 ක් ව්‍යාප්ති හා උපදේශක සේවා සඳහා සහභාගී වී තිබූ අතර, ඉකුත් වර්ෂය සමඟ සැසැදීමේදී එය 16.39% ක අඩුවීමක් විය.

(iii) ව්‍යාප්ති සේවා වලට අදාලව ගන්නා ලද තීරණයන්ට අනුව, ව්‍යාප්ති නිලධාරියෙකුට වගාකරුවන් අනුපාතය 1:1000 ක් විය යුතුය. කෙසේ වුවද, අධිකාරියේ තොරතුරු වලට අනුව, ව්‍යාප්ති නිලධාරියෙකුට වගාකරුවන් තත්‍ය අනුපාතය 1:2,650 ක් විය. පුද්ගල වගාකරුවන් සඳහා අඩු අවධානයක් යොමු කර ඇති බව ඒ අනුව පෙනී යයි. වර්ෂය අවසානයට තේ ව්‍යාප්ති නිලධාරීන්ගේ පුරප්පාඩු සංඛ්‍යාව 16 ක් විය.

(iv) අධිකාරියේ තොරතුරු වලට අනුව, සමාලෝචිත වර්ෂය තුල පුහුණු වැඩසටහන් 5,275 ක් පවත්වා තිබුණු අතර එය ඉලක්කගත පුහුණු වැඩසටහන් වලින් 80% ක ප්‍රගතියක් විය.

(ඇ) ආයතනික පැල තවාන්

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) මූල්‍ය ප්‍රකාශන වලට අනුව සමාලෝචිත වර්ෂය තුල පැල තවාන් 6 ක මෙහෙයුම්වලින් ප්‍රතිඵලය රු.870,639 ක ලාභයක් වූ අතර, ඊට අනුරූපව ඉකුත් වර්ෂයෙ ලාභය රු.236,206 ක් වූයෙන් රු.634,433 කින් මූල්‍ය ප්‍රතිඵලයේ වර්ධනයක් දැක්වුණි.

(ii) සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ තුලදී තිස්පනේ පැල තවානෙන් පිළිවෙලින් රු.64,054 ක හා රු.725,541 ක අලාභයක් සිදුවී තිබුණි.

(iii) සමාලෝචිත වර්ෂය තුලදී අධිකාරියේ පැල තවාන් 6 ක පැල158,535 ක සංඛ්‍යාවක් මැරී තිබුණු අතර, එය මුළු පැල සංඛ්‍යාවෙන් 24% ක් විය. රහතුන්ගොඩ, හන්තාන හා තිස්පනේ පැල තවාන් වල මැරුණු පැල සංඛ්‍යාව වර්ෂය තුලදී අසාමාන්‍ය ලෙස වැඩිවී තිබුණු අතර එය පිළිවෙලින් 30%, 27% හා 21% ක් විය. මෙයට ප්‍රධාන වශයෙන් හේතු වූයේ අයහපත් කාලගුණය බව අධිකාරියේ සභාපති විසින් ඔහුගේ පිළිතුරෙහි දක්වා තිබුණි.

(ඈ) ව්‍යාපාරික පැල තවාන් ලියාපදිංචි කිරීම

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) අධිකාරියේ තොරතුරු වලට අනුව , සමාලෝචිත වර්ෂය තුලදී අධිකාරියේ ප්‍රාදේශීය කාර්යාල මගින් පැල තවාන් 663 ක් ලියාපදිංචි කර තිබුණි.ඒ අතරින් පැල විකිණීමට යෝග්‍ය පැල තවාන් ලෙස නිර්දේශ වී තිබුණේ පැල තවාන් 31ක් පමණකි.

(ii) කළුතර ප්‍රාදේශීය කාර්යාලය පැල තවාන් 37 ක් ලියාපදිංචි කර තිබුණද , සමාලෝචිත වර්ෂය අවසානය දක්වා පරීක්ෂණ කටයුතු (පැල විකිණීමට පෙර කල යුතු) නිම කර නොතිබුණි.

(iii) මාතර හා කළුතර ප්‍රාදේශීය කාර්යාල විසින් මුළු ලියාපදිංචි පැල තවාන් වලින් පිළිවෙලින් 4.2 ප්‍රතිශතයකින් ක් හා 6.3 ප්‍රතිශතයකින් පරීක්ෂණ කටයුතු නිම කර තිබුණි.

(iv) සමාලෝචිත වර්ෂය තුලදී නුවරඑළිය ප්‍රාදේශීය කාර්යාලය විසින් කිසිදු ලියාපදිංචි කිරීමේ කාර්යයක් කර නොතිබුණි.

(ඉ) තේ පොහොර බෙදාහැරීම

තේ පොහොර බෙදා දීමේ ගිණුමට අනුව, සමාලෝචිත වර්ෂය තුලදී කුඩා තේ වතු හිමියන්ට ලබා දෙන ලද පොහොර ප්‍රමාණය කිලෝ ග්‍රෑම් 67,735 ක් වූ අතර පෙර වර්ෂය සමඟ සැසඳීමේදී එය කිලෝ ග්‍රෑම් 292,473 කින් එනම් 81% කින් අඩුවී තිබුණි. පොහොර බෙදා හැරීමේ මධ්‍යස්ථානවල ලාභය/පාඩුව ඉකුත් වර්ෂය සමඟ සසඳා පහත දැක්වේ.

| පොහොර මධ්‍යස්ථානය | වර්ෂය සඳහා ශුද්ධ ලාභය/(පාඩුව) | | වැඩිවීම/(අඩුවීම) |
|---|---|---|---|
| | 2011 | 2010 | |
| සරසවිඋයන | (174,121) | 5,131 | (179,258) |
| පොරමඩුල්ල | (132,161) | 7,803 | (139,964) |
| හිඟුල | (269,247) | 13,235 | (282,482) |
| ගම්පොල | 134,044 | (190,017) | 324,060 |
| ගිනිගත්හේන | - | (62,427) | (62,427) |
| බණ්ඩාරවෙල | (2,219) | 64,444 | (66,663) |

සභාපතිගේ අදහස් දැක්වීම් වලට අනුව, ජාතික පොහොර යෝජනා ක්‍රමය ස්ථාපනය කිරීමෙන් පසුව මෙම පොහොර මධ්‍යස්ථාන ක්‍රියාත්මක නොවේ.

3.3 හඳුනාගන්නා ලද පාඩු

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) කෑගල්ල ප්‍රාදේශීය කාර්යාලයේ හිඟුල පොහොර මධ්‍යස්ථානයේ කිලෝ ග්‍රෑම් 6,525ක තොගයක් සමාලෝචිත වර්ෂය තුළදී හානිවී විනාශ කර තිබුණි.

(ii) වාහන ලියාපදිංචිය අළුත් කිරීම ප්‍රමාද වීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය තුළදී දඩ මුදල් ලෙස රු.7,045 ක මුදලක් ගෙවා තිබුනි.

## 3.4 වත්කම් කළමනාකරණය

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) සමාලෝචිත වර්ෂය තුළදී සිදු කරන ලද විගණන පරීක්ෂාවේදී වලහන්දූව වත්තේ සංචාරක බංගලාවක් උපයෝජනය කිරීමෙන් තොරව වර්ෂ 10 කට වැඩි කාලයක් නිශ්කාර්යව පැවති බව නිරීක්ෂණය විය.තවද වලහන්දූව වත්තට අයත් පොහොර ගබඩා සහ ජල ටැංකියද වර්ෂ 05 කට වැඩි කාලයක් නිශ්කාර්යව පැවතුණි.

(ii) වලහන්දූව වත්තේ සේවක නිල නිවාස 3ක් දීර්ඝ කාලයක සිට බාහිර පාර්ශවයන් විසින් බලෙන් අල්ලාගෙන තිබුණි.

## 3.5 වෙනත් ආයතන විසින් වත්කම් උපයෝජනය කිරීම

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12/දරණ රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 8.3.9 ඡේදයට පටහැනිව 2011 අගෝස්තු 11 දින සිට රේඛීය අමාත්‍යාංශයට වාහනයක් මුදා හැර තිබුණි.

(ii) 1992 වර්ෂයේදී ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන ව්‍යාපෘතිය මගින් රු.800,000 ක් වටිනා ගොඩනැගිල්ලක් කෑගල්ල ප්‍රාදෙශීය කාර්යාලයට පරිත්‍යාග කර තිබුණි. කෙසේ වුවද, 1993 වර්ෂයේ සිට සබරගමුව පලාත් සභාවේ කෘෂිකර්ම අමාත්‍යවරයාගේ කාර්යාලය සඳහා එම ගොඩනැගිල්ල භාරගෙන කුලී ගෙවීමකින් තොරව උපයෝජනය කර තිබුණි.

## 3.6 මානව සම්පත් කළමනාකරණය

2011 දෙසැම්බර් 31 දිනට අධිකාරියේ අනුමත හා තත්‍ය සේවක සංඛ්‍යාව පිළිබඳ විස්තර පහත දැක්වේ.

| තනතුර | අනුමත සේවක සංඛ්‍යාව | තත්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත තනතුරු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| විධායක | | | | |
| - ජ්‍යෙෂ්ඨ මට්ටම | 03 | 02 | 01 | - |

| | | | | |
|---|---|---|---|---|
| - මධ්‍යම මට්ටම | 36 | 19 | 17 | - |
| - කණිෂ්ඨ මට්ටම | 44 | 33 | 11 | - |
| ද්විතීක මට්ටම | 166 | 147 | 19 | - |
| තෘතීය මට්ටම | 127 | 168 | - | 41 |
| ප්‍රාථමික මට්ටම | 46 | 55 | - | 9 |
| එකතුව | 422 | 424 | 48 | 50 |

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) 2011 දෙසැම්බර් 31 දිනට විධායක ශ්‍රේණි ඇතුළුව පුරප්පාඩු 48ක් හා විධායක නොවන ශ්‍රේණි හා කණිෂ්ඨ සේවක සංඛ්‍යාවෙහි අතිරික්ත සේවක සංඛ්‍යාව 50ක් විය. කෙසේ වුවද, 2010 ජුනි 29 දිනැති අංක ඩීඑම්එස්/ඊ4/08/5/070/1 දරණ කළමනාකරණ සේවා ලිපිය ප්‍රකාරව ඒ වන විට සේවයේ යෙදී සිටි සේවකයන්ට පෞද්ගලික වන පරිදි කළමනාකරණ සහකාරවරුන් 55 ක් හා කම්කරුවන් 13 දෙනෙකු අනුමත කර තිබුණි.

(ii) සමාලෝචිත වර්ෂය අවසානයට ප්‍රාදේශීය කළමනාකරුවන් තිදෙනෙක් හා ව්‍යාපෘති, සැලසුම් හා සංවර්ධනය සඳහා සහකාර ප්‍රාදේශීය කළමනාකරුවන් 11ක් පුරප්පාඩු වී තිබුණි.

සභාපතිගේ අදහස් දැක්වීම් වලට අනුව, සේවා උසස් කිරීම් වල ආරවුල් හා ව්‍යාපෘති, සැලසුම් හා සංවර්ධනය සඳහා සහකාර ප්‍රාදේශීය කළමනාකරුවන් බඳවා ගැනීම පිළිබඳ උසාවි නඩුවක් හේතුවෙන් ප්‍රාදේශීය කළමනාකරුවන් හා සහකාර ප්‍රාදේශීය කළමනාකරුවන් බඳවා ගැනීම තාවකාලිකව නතර කර තිබුණි.

4. පද්ධති හා පාලන.

--------------------

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු මුදල් පනතේ 13 (7) (ඒ) වගන්තිය ප්‍රකාරව නිකුත් කරන ලද මාගේ විස්තරාත්මක වාර්තාව මගින් අධිකාරියේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමු කල යුතුය.

(අ) ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

(ආ) තොග

(ඇ) බැංකු සැසඳුම්

(ඈ) සහනාධාර ගෙවීම

(ඉ) වාහන උපයෝජනය